**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 26 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය රු.419,532 ක් වියයුතු නමුත්, ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමෙහි රු.1,000,000 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබීම හේතුවෙන් ජංගම වගකීම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව එවූ තොරතුරු වැරදි සහගත බව දන්වමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.122,964 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| 2017 වර්ෂය ට පෙර සිට පැවත එන රු.10,383,918 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි | ලැබිය යුතු ගිණුම්වල ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | කාලයක සිට පැවත එන එම ශේෂ ඉදිරියේ දී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන එකතුව රු.18,257,394 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතුව රු.12,521,811 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සඳහා තොරතුරු හා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ii) රීති 69 | ඉඩම් විකිණීම මත වන බදු පිළිබඳ ලේඛනයක් පී.එස්.26 ඩී ආකෘති පත්‍රය ප්‍රකාර පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iii) රීති 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5.1 වගන්තිය | සභාව සතු වාහන 11 ක ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ලොග් සටහන් යාවත්කාලීන කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,100,673 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,061,070 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,503,040 | 805,425 | 801,739 | 260,736 | 1,398,040 | 733,698 | 750,154 | 257,050 |
| කුලී | 7,094,000 | 6,042,961 | 6,006,887 | 253,074 | 4,715,000 | 5,555,566 | 5,556,581 | 217,000 |
| බලපත්‍ර ගාස්තු | 864,000 | 759,922 | 1,770,422 | (7,250) | 1,659,000 | 2,631,307 | 1,622,307 | 1,003,250 |
| වෙනත් ආදායම් | 66,602,000 | 89,756,121 | 63,279,250 | 34,359,919 | 64,465,000 | 34,954,519 | 37,442,557 | 7,883,048 |
| | 76,063,040 | 97,364,429 | 71,858,298 | 34,866,479 | 723,237,040 | 43,875,090 | 45,371,599 | 9,360,348 |

#### 2.2.2. අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.198,549 ක් වූ අතර, වාර්ෂික බිල් කිරීම් රු.37,610 ක් විය. මෙම වර්ෂයේ අයකර ගැනීම් රු.23,808 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.167,032 ක් විය. සභාවට අක්කර බදු ගෙවිය යුතු මුළු පුද්ගලයින් සංඛ්‍යාව 493 ක් වූ අතර, 2019 වර්ෂය තුළ බදු මුදල් නොගෙවූ සංඛ්‍යාව 230 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,896,160 ක් හා මුද්දර ගාස්තු රු.32,310,415 ක් විය. ප්‍රධාන ලේකම්ගේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු වෙනුවෙන් කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව දක්වා තිබුණි. | නිවැරදි තොරතුරු සභාවේ පොත්වල දැක්විය යුතුවේ. | ගිණුම්වල ලැබිය යුතු ආදායම් ඇති බව පෙන්නුම් කරන බව දන්වමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත තනතුරුවල ද්විතීයික හා ප්‍රාථමික පන්තියේ පැවති පුරප්පාඩු 07 ක් සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු පුරවනුයේ ප්‍රධාන අමාත්‍යාංශය හරහා බව දන්වමි. |

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙළඳ බලපත්‍ර ඉල්ලුම් කරමින් 2019 වර්ෂයට අයදුම්පත් භාර දී තිබූ කඩහිමියන් 24 දෙනෙකුගේ අයදුම්පත් වල අඩුපාඩු නිවැරදි කර ගන්නා ලෙස දන්වා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරයා විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් ව්‍යාපාරික ස්ථාන 16 ක් බලපත්‍ර නොමැතිව විවෘතව තිබුණි. | බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතු අතර බලපත්‍ර ලබා නොගන්නා කඩහිමියන්ට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුවේ. | නීතිමය කටයුතු කිරීමට ආදායම් පරීක්ෂකතුමිය වෙත භාර දුන්නද, එතුමිය නිවාඩු ලබා ඇති බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වාහන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2015 ජූලි 10 අංක 02/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු මිනි ට්‍රැක්ටරය අපහරණය කිරීමට කටයුතු නොකර සභා භූමියේ ගාල් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අබලි වාහන ඉවත් කළ යුතුවේ. | ගැටළු නිරාකරණය කර ගෙන ඉදිරියේ දී අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| එක් ඩබල් කැබ් රථයක් 2019 ජනවාරි 31 දින සිට අළුත්වැඩියාවක් නිසා හා තවත් ඩබල් කැබ් රථයක් අලුත් ටයර් යෙදීමට සහා අරමුදල් නොමැති වීමෙන් ධාවනය නොකර තිබුණි. තවද 2017 දෙසැම්බර් සිට ධාවනය කර නොතිබූ ට්‍රැක්ටරය හා ට්‍රේලරය අළුත්වැඩියා සඳහා 2019 පෙබරවාරි සිට ගරාජයකට දමා තිබුණ ද, අළුත්වැඩියාව කර නොතිබුණි. | කඩිනමින් වාහන අළුත්වැඩියා කර ගත යුතුවේ. | අළුත්වැඩියාවන් සඳහා විශාල මුදලක් වැය වන බැවින් සභාව සතුව මුදල් නොමැති බව දන්වමි. |

**3.4.3 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාව මඟින් පාලනය වන වෙළෙන්දාව වත්ත භූමි ප්‍රමාණයෙන් අක්කර 3 ½ ක භූමි ප්‍රමාණයක් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට උපයෝජනය කර නොතිබුණි. | ඵලදායී ආර්ථික කටයුත්තකට යොදාගත යුතුවේ. | ඉදිරියේදී වගා කටයුතු සඳහා යොදා ගන්නා බව දන්වමි. |